# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2003/43 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2017.01.06 දිනැති අංක 2000/85 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 1006.30.10, 1006.30.20 සහ 1006.30.30 යටතට වැටෙන සහල් ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 15ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 10ක් අත්හරිනු ලැබිය යුතු බවට නියම කරනු ලැබේ.

මෙම නියමය අනුව සහල් ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 5ක් ලෙස 2017 ජනවාරි මස 28 වැනි දින සිට ආරම්භ වන දින 30ක කාල සීමාවක් තුළදී අයකර ගත යුතු ය.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2017 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

02 - 617


1A - PG 3377 — 532 (2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*